මුහුණක් තිබුණි නම් වඩා හොඳයැයි සිතුණිද? බොහෝ අවස්ථාවල එසේ සිතී ඇතිවා විය යුතුය. එසේ නම් මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. ඔබට හොඳ නැති මුහුණක් ඔබ තියාගෙන සිටින්නේ ඇයි ? ඔබට අවශ්‍ය ආකාරයෙන් ඒ මුහුණ රවුම්කර, පැහැපත් කර, මනෝර්මය කර නොගන්නේ ඇයි? නාසයේ හැඩය එලෙස වෙනස් කර නොගන්නේ ඇයි? ඇස්වල හැඩය එලෙස වෙනස් කර නොගන්නේ ඇයි? නිකරේ හැඩය හෝ කණ්වල හැඩය වෙනස් කර නොගන්නේ ඇයි? එසේ කරගැනීමට හැකියාවක් ඔබ සතු නොවන නිසා නොවේද? කළ හැකි යමක් නොමැති නිසා ඔබට ලැබුණු මුහුණ ඒ ආකාරයෙන්ම තිබෙන්නට හැර තිබෙනවා නොවේද ? සත්‍යයය එයයි. ඔබේ මුහුණ ඔබ කැමැති ආකාරයට වෙනස් කර ගැනීමේ හැකියාවක් ඔබට නොමැත. ඔබට ඔබේ මුහුණ පිළිබඳ ඇත්තේ සීමිත අයිතියක් පමණකි. මේ ආකාරයෙන් සිතා බැලුවහොත් මුහුණ පමණක් නොව ඔබේ මුළු ශරීරය පිළිබඳවම ඔබට ඇත්තේ සීමිත අයිතියක් පමණක් බව අවබෝධ වනවා ඇත. ඒ අයිතිය කුළි නිවැසියෙකුට ඒ නිවෙස පිළිබඳ ඇති අයිතියට සමාන සීමිත අයිතියක් බව ඔබට වැටහෙනවාද ? ඔබට ඔබේ ශරීරය පිළිබඳව පරම අයිතියක් නැති බව දැන් ඔබට වැටහෙනවාද?

''මගේ'' යැයි සැළකිය හැක්කේ යමක් අපට අවශ්‍ය ආකාරයට පවත්වා ගැනීමට සහ නවත්වා ගැනීමට හැකියාවක් ඇත්නම් පමණකි. ඔබට ඔබේ සිරුරවත් ඔබට අවශ්‍ය ආකාරයට පවත්වා ගැනීමට හෝ නවත්වා ගැනීමට නොහැකිය. එයට ඔබට අවශ්‍ය අකාරයේ උස මහතක් දීමට ඔබට නොහැකිය. වර්ණයක් දීමට ඔබට නොහැකිය. හැඩයක් දීමට ඔබට නොහැකිය. එපමණක්ද? නැත. ඔබට අවශ්‍ය ආකාරයේ ක්‍රියාකාරිත්වයක් ඔබේ මුහුණට දීමටද ඔබට නොහැකිය. මුහුණ පමණක් නොව ඔබගේ මුළු ශරීරයම පවතින්නේද, නවතින්නේද ඊටම ආවේනික ආකාරයකට මිස ඔබට වුවමනා ආකාරයට නොවේ. ශරීරය අපිරිසිදු වෙනවාට අප කිසිවෙක් කැමති නැත. එබැවින් ශරීරය පිරිසිදුව තබාගැනීමට අපි බොහෝ වෙහෙසක් දරන්නෙමු. දවසකට කිහිප වාරයක් සෝදන්නෙමු. කොපමණ සේදුවත් නැවත නැවතත් අපිරිසිදු භාවයට පත්වීම ශරීරයේ ස්වාභාවයයි. මේ ආකාරයෙන් කරුණු කාරණා විමසා බැලීමේදී ඔබේ යැයි ඔබ කියන ශරීරයේ පරම අයිතිය ඔබට නොමැති බව පැහැදිලි විය යුතුය.

එසේ තිබියදී මේ ශරීරය පිළිබඳ ''මගේ'' යැයි කල්පනාවක් අපට ඇතිවන්නේ නම් එය නිවැරදි කල්පනාවක් නොවේ. නොදන්නාකම නිසා ඇතිවන වැරදි කල්පනාවකි. ශරීරයේ විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විමසා බලන්න. හුස්ම ගැනීම පවා සිදුවන්නේ ශරීරයේ අවශ්‍යතාව මත ඊට වුවමනා ආකාරයෙනි. අපි හුස්ම ගන්නවා යැයි කියනවාට වඩා නිවැරදි වන්නේ හුස්ම වැටෙනවා යැයි කීමය. හුස්ම ගැනීම අපි කරන වැඩක් නොව ශරීරයේ ඉබේ සිදුවන වැඩකි. අපි කිසියම් ආහාරයක් ගත් විට එයින් කිසියම් ප්‍රමාණයක් ශරීරයට උරාගෙන සෙසු කොටස් ශරීරයෙන් බැහැර කිරීම ඔබගේ තීරණයක් මත සිදුවන්නක් නොව ශරීරයේ ඉබේ සිදුවන්නකි. ඔබ කැමැති වුවද අකමැති වුවද ශරීරයට අවශ්‍ය වූ විට බහිස්ශ්‍රාවීය කටයුතු සිදු කෙරෙයි. රුධිරයේ සීනි ප්‍රමාණය ඉහළ නන්යයි. රුධිර පීඩනය ඉහළ හෝ පහළ යවයි. දහඩිය දමයි. ශරීරය ඔබේ නම් ඔබ සීනි නන්වනවාට අකමැති බැවින් ශරීරය සීනි නොනැන්විය යුතුය. ඔබ දහඩිය දමනවාට අකමැති බැවින් දහඩිය නොදමා සිටිය යුතුය. එහෙත් ඔබ ''මගේ'' යැයි සිතා සිටින ශරීරය ක්‍රියාකරන්නේ ඔබේ මනාපය අනුව නොව එයට අවශ්‍ය කිසියම් ආකාරයකටය. එය ඔබේ පාලනයෙන් බැහැරය.

එසේ නම් ශරීරය පිළිබඳ අපට ඇති ''මගේ'' යන හැඟීම වැරදි හැඟීමකි. වැරදි ආකල්පයකි. වැරදි දෘෂ්ටියකි. එසේ නම් එය නිවැරදි කරගත යුතු නොවන්නේද ? නිවැරදි කරගත යුතුය. එසේ නොවුව හොත් සිදුවන්නේ දුකට පත්වීමය. තමන්ගේ ශරීරය වත් තමන්ට අයිති නැතිව තිබියදී අපි බොහෝ විට අනුන්ගේ ශරීර පවා ''මගේ'' කරගෙන සිටීම සැබැවින්ම හාස්‍ය ජනක නොවන්නේද ? අපි ඇතැම් අයගේ ශරීරවලට හිමිකම් කියන්නේ ''මගේ'' යන්නට තවත් විශේෂණයක්ද එක් කරමිනි. එනම් ''මගේම'' යනුවෙනි. අපිට මේ ආකාරයෙන් අනුන්ගේ ශරීර පවා ''මගේ'' යැයි සිතෙන්නේ දෘෂ්ටියේ වැරදීමක් නිසා බව දැන් ඔබට පැහැදිලි විය යුතුය. මේ වරද නිවැරදි කරගැනීමට හැකි වන්නේ දෘෂ්ටිය නිවැරදි කරගැනීමෙන් පමණි.

House for sale in Kelaniya

41 ½ Perches Land, 2 Large Store Rooms with a bare-land
2 Storied Spacious House with 4 Bedrooms and 2 Bathrooms
1 Large outdoor Kitchen in addition to the Kitchen inside
Separate Servant Rest Room and Bath Room
2 Large Store Rooms with a bare-land
House is surrounded by 2 prominent schools in Gampaha
The property is located in just 3.5 Kms from Colombo City

Contact Details- 0433298305 or +94 774137711

IMMIGRATION LAW @
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

Professional Immigration Legal Services
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...